# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2363/03 - 2023 දෙසැම්බර් මස 18 වැනි සඳුදා - 2023.12.18

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1968 අංක 32 දරන පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ පනත**

36(2) වගන්තිය යටතේ නිවේදනය

මහජන ආරක්ෂක අමාත්‍ය ටිරාන් අලස් වන මම, 1968 අංක 32 දරන පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ පනතේ 36 වන වගන්තියේ (2) වන උප වගන්තියෙන් මා වෙත පැවරෙන බලතල ප්‍රකාරව, ලියාපදිංචි කරන ලද ඡායාරූප ශිල්පියෙකු විසින්, ලියාපදිංචි වී හැඳුනුම්පතක් හෝ හැඳුනුම්පතක අනුපිටපතක් ලබා ගැනීමට අයදුම්පතක් ඉදිරිපත් කරන පුද්ගලයකුගේ, ජාත්‍යන්තර සිවිල් ගුවන් සේවා සංවිධානයේ (ICAO) සම්මතයන්ට අනුකූලව ලබාගන්නා ලද ඩිජිටල් රූපය (digital image) මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවේ e photo studio මෘදුකාංග පද්ධතිය වෙත යොමු කර ඒ බව තහවුරු කිරීමේ ලේඛනය (Photographic Reference Slip) අයදුම්කරු වෙත ලබාදීම සඳහා අය කළ යුතු උපරිම ගාස්තුව රුපියල් හාරසියයක (රු. 400.00) මුදලකට සීමා විය යුතු බව මෙම නිවේදනය මගින් ප්‍රකාශයට පත් කරමි.

මෙම කාරණයට අදාළව 2016 මැයි මස 05 වන දින අංක 1965/33 දරන *ගැසට් පත්‍රයේ* පළ කරන ලද නිවේදනය මෙයින් අවලංගු කරමි.

ටිරාන් අලස්,
මහජන ආරක්ෂක අමාත්‍ය.

2023 දෙසැම්බර් මස 13 වැනි දින,
මහජන ආරක්ෂක අමාත්‍යාංශයේ දී ය.

EOG 12 - 0260

1A - G 41035 — 07 (2023/12)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*